ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

Lien ජංගම ගිණුම

නිමැවුමේ ස්වභාවය	**ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ**	**ආරම්භක තැන්පතු හා ගාස්තු**	**සුදුසුකම**	**ප්‍රධාන නියමයන් හා කොන්දේසි**
Lien ජංගම ගිණුම විශේෂ ජංගම ගිණුමක් වන අතර ඇපකර අරමුදල් යෝජනාක්‍රම හා සම්බන්ධ ව්‍යාපාර නිසි ලෙස පවත්වාගෙන යාම සඳහා ජංගම ගිණුමේ පවත්වාගෙන යන අරමුදල් මත Lien අයිතීන් සක්‍රියකිරීමට අදාළ ව්‍යාපාර අවශ්‍යතා සඳහා මෙම ගිණුම හඳුන්වා දෙන ලදි.	• ගිණුම් විවෘත කිරීම සඳහා ආරම්භක තැන්පතුවක් අවශ්‍ය නොවේ. • අවම ශේෂය පවත්වාගෙන යාම අවශ්‍ය නොවේ. • අයිරා පහසුකම් ලබා නොදේ. • චෙක්පත් නිකුත් නොකෙරේ. • ගිණුම්හිමියා සඳහා නොමිලේ කෙටි පණිවුඩ පහසුකම • ගිණුම්හිමියා සඳහා ඊමේල් හරහා සහ CGF වෙත තැපැල හරහා මාසික ගිණුම් ප්‍රකාශන • හර කාඩ්පත් / අන්තර්ජාල බැංකු පහසුකම් / ඩිජිටල් පාදක මුදල් හුවමාරු කිරීමේ පහසුකම් නොමැත. • තැන්පතු ශේෂය ඇපයට තබා අත්තිකාරම් ලබා ගැනීමට අවසර නැත. • ගිණුම ඇපකර ආයතනයේ ඇපයක් වන අතර සියලු ගෙවීම්/ මුදල් ආපසුගැනීම් සඳහා අදාළ තුන්වන පාර්ශවයේ (Lien Holder) පූර්ව ලිඛිත අනුමැතිය හා ගිණුම්හිමියාගේ ඉල්ලීම අවශ්‍ය වේ.	• ගිණුම් විවෘතකිරීම සඳහා ආරම්භක තැන්පතුවක් අවශ්‍ය නොවේ. • **කොමිස් සහ ගාස්තු** ගිණුමෙන් සිදුවන සෑම මුදල් මාරුකිරීමක් සඳහාම කොමිස් මුදලක් අය කෙරේ: **අරමුදල් බැරවන ගිණුම *** **අරමුදල් මාරු කිරීමේ වටිනාකම මත කොමිස් මුදල (%)** **අවම කොමිස් මුදල (රු.)** **උපරිම කොමිස් මුදල (රු.)** BOC ජංගම ගිණුම: 0.75%, 1,000, 100,000 වෙනත් බැංකු ගිණුම: 1%, 2,000, 150,000 **** Lien ගිණුමෙන් ගෙවන ලද සියලු අරමුදල් බැරකිරීම සඳහා ගනුදෙනුකරු විසින් නම්කළ ඉතිරිකිරීමේ හෝ ජංගම ගිණුම*** • BOC ගිණුම් සඳහා, කොමිස් මුදල ගනුදෙනුකරුගේ අරමුදල් බැරවන ගිණුමෙන් වෙනම අය කෙරේ. • අරමුදල් බැරවන ගිණුම වෙනත් බැංකුවක පවත්වාගෙන යන්නේ නම්, අරමුදල් මාරු කිරීමට පෙර කොමිස් මුදල කපා ගනු ලබයි. • **ගිණුම පවත්වාගෙන යාමේ හා වෙනත් ගාස්තු**	• CONSTRUCTION GUARANTEE FUND (CGF) හි ලියාපදිංචි දැනට සිටින හෝ නව ගනුදෙනුකරුවන් වන, i) තනි පුද්ගල ව්‍යාපාර ii) හවුල් ව්‍යාපාර iii) සීමිත වගකීම් සමාගම් විසින් ගිණුම් විවෘත කළ හැකිය. **ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර** ගිණුම් විවෘතකිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි: • Lien ජංගම ගිණුම් විවෘතකිරීමේ අයදුම්පත • Lien ජංගම ගිණුම විවෘතකිරීම සඳහා Lien Holder විසින් බැංකුවට ඉදිරිපත් කළ ඉල්ලීම් ලිපිය • ව්‍යාපාර ආයතනයේ වර්ගය මත පදනම් වූ අනෙකුත් අදාළ ලියකියවිලි (උදා: ව්‍යාපාර ලියාපදිංචි සහතිකය/ සමාගම් ලියාපදිංචිය / ගිණුම විවෘතකිරීමට මණ්ඩල යෝජනාව/ බලයලත් අත්සන්කරුවන්) අරමුදල් නිදහස් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි: • ගිණුම්හිමියාගේ ඉල්ලීම් ලිපිය • Lien Holder විසින් ලබා දෙන තහවුරු කිරීම.	• ගිණුම "එක් ගනුදෙනුකරුවෙකුට එක් ගිණුමක්" යන පදනම මත විවෘත කර පවත්වාගෙන යා යුතුය. • මුදල් ආපසුගැනීම් හා ගෙවීම් සඳහා අදාළ නෙවන පාර්ශවයේ (Lien Holder) පූර්ව අනුමැතිය අවශ්‍යවේ. • මුදල් ලබාගැනීමේ ඉල්ලීම්, ගිණුම් විවෘත කළ ශාඛාවේදී පමණක් සහ ගිණුම්හිමියාගේ නමටම/එම හිමිකාරිත්වය යටතේ පවතින ගිණුමකට පමණක් අරමුදල් බැර කිරීම කරනු ලැබේ. • Lien ජංගම ගිණුමෙන් මුදල් කවුන්ටරය හරහා මුදල් ආපසු ගැනීම්වලට අවසර නොලැබේ. • මාසික ගිණුම් ප්‍රකාශන ගිණුම්හිමියාට විද්‍යුත් තැපෑලෙන් සහ CGF වෙත තැපෑලෙන් එවනු ලැබේ. • ගිණුම් වසා දැමීම පහත සඳහන් අවස්ථාවලදී ගිණුම වසා දැමිය හැකිය: - ගිණුම්හිමියාගේ මරණය - හවුල්කාරිත්වයක් අවසන් කිරීම - සමාගමක් ඈවර කිරීම - ගනුදෙනුකරුගේ ඉල්ලීම ගිණුම වසා දැමීමට පෙර Lien Holderගේ තහවුරු කිරීම අනිවාර්ය වන අතර ඉතිරි අරමුදල් වසා දැමීමෙන් පසු Lien Holder වෙත මාරු කරනු ලැබේ.

Classification: Internal

		ගාස්තු දැනගැනීමට https://www.boc.lk/rates-tariff#general-tariff වෙත පිවිසෙන්න. • **බදු -** පොලිය රජය සහ/හෝ ශ්‍රී ලංකා නියාමන අධිකාරිය හෝ බැංකුව විසින් කලින් කලට නියමකරනු ලබන අදාළ ඉහළ ආදායම් බදු (Advance Income Tax) අඩුකිරීම්, වෙනත් බදු (AIT), ගාස්තු (ඇත්නම්) වලට සහ ව්‍යවස්ථාපිත අයබදුවලට යටත් වේ.		• ගනුදෙනුකරුගේ ගිණුමක් සම්බන්ධයෙන් අධිකරණ නියෝගයක් ලැබුනේ නම්, බැංකුව එම නියෝගයට අනුකූල විය යුතුය.

රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අනපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- එක් තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.
- අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය;
- අපගේ Customer Experience Management අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා සලකා බලනු ලැබේ.

දුරකතන: +94 11 220 4750 / +94 11 243 5814 **ෆැක්ස්**: +94 11 243 5815 **විද්‍යුත් ලිපිනය**: bocexmgt@boc.lk **වෙබ් අඩවිය:** https://www.boc.lk

තැපෑල: Customer Experience Manager, 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.

අපගේ කුමන හෝ ශාඛාවක්, සේවා ඒකකයක්, හෝ ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න.

අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.